# ලංසු සඳහා ආරාධනයයි (IFB)

**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව - බඩල්කුඹුර**

01. ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ විස්තර කර ඇති පරිදි වන ඉදිකිරීම් කටයුතු සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් 2026.08.21 දින සිට 2026.09.04 දින දක්වා මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

| ඉදිකිරීමේ නම | ඇස්තමේන්තු වටිනාකම් රු.මි ( Vat රහිත) | අවශ්‍ය ICTAD ශ්‍රේණිය (CIDA) | කොන්ත්‍රාත් කාලය/ සීමාව | අවශ්‍ය ලංසු සුරක්ෂණය | | ලංසු වලංගු කාලය(දින) (ලංසු ඉදිරිපත් කල යුතු අවසාන දින සිට) | ආපසු ගෙවනු නොලබන ලංසු ලියවිලි ගාස්තු (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | සුරක්ෂණයේ වටිනාකම (රුපියල්) | වලංගු කාල සීමාව | | |
| පරෙයියන්ඇල්ල ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම | 4.1 | C8 or C7 or C6 in Highway | මාස 02 | 41,000/- | 2026 නොවැම්බර් 20 දින දක්වා | 49 (දින) | 2,000/- |

02. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය හරහා ලංසු කැඳවීම සිදු කෙරේ.

03. කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා සුදුසු වීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු වන අතර, ඉහත වගුවේ දක්වා ඇති පරිදි අවශ්‍ය අවම CIDA ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. ලංසු ඇගයීමේදී පහත දැක්වෙන සුදුසුකම් සලකා බලනු ලැබේ. ලංසු ලිපි ලේඛනයෙහි 4 වන කොටසේ දක්වා ඇති සුදුසුකම් තොරතුරු වගුව යථා පරිදි නිවැරදිව සම්පූර්ණ කල යුතු අතර, ඇගයීම් ක්‍රියාවලියේදී සලකා බලනු ලැබේ.
    - පසුගිය වසර පහ තුළ සමාන ස්වභාවයේ කර්මාන්ත එකක් සම්පූර්ණ කර තිබීම.
    - මූල්‍ය හැකියාව හා ස්ථාවරත්වය
    - දැනට කෙරෙමින් පවතින කර්මාන්තයන්හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය

05. ලංසුකරුවන් 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි සහතිකය ලංසු සමඟ ඉදිරිපත් කල යුතුය.ලියාපදිංචි සහතිකය හෝ ලියිපදිංචිය තහවුරු කෙරෙන ලිපිලේඛන රහිත ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ඉහත වගුවෙහි සඳහන් ලංසු ලිපි ලේඛන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2026.08.21 දින සිට 2026.09.03 දින ප.ව.3.00 දක්වා කාර්යාල වේලාව තුළදී අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ අංග සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදී ගත හැක.ගෙවීම් මුදලින් කල යුතුය.ලංසු ලිපි ලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

07. ලංසු සුරක්ෂණය නැවත ගෙවනු ලබන මුදල් තැන්පතුවක් ලෙස හෝ අනුමත ආකෘතියෙන් යුත් බැංකු ඇපකරයක් ලෙස ඉදිරිපත් කල යුතුය.
    - ලංසු සුරක්ෂණය බැංකු ඇපකරයක් ලෙස ඉදිරිපත් කරන්නේ නම්,එය ලංසු ලිපි ලේඛනයෙහි ඇතුළත් අනුමත ආකෘතිය (සම්මත ආකෘතිය) අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවක් වෙතින් ලබාගත යුතුය.බැංකු ඇපකරය අවලංගු කල නොහැකි ,කොන්දේසි විරහිත සහ ප්‍රසම්පාදන අස්තිත්වයේ පළමු ලිඛිත ඉල්ලීමෙන්ම ගෙවනු ලබන එකක් විය යුතුය.ලංසු සුරක්ෂණය ඉහත වගුවේ සඳහන් පරිදි වලංගු විය යුතුය.

08. යථා පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලිපි ලේඛන,අනුපිටපතක් සහිතව "මුල්පිටපත" සහ "අනුපිටපත" ලෙස සලකුණු කර වෙන වෙනම කවර දෙකක බහා නැවත එම කවර දෙක තනි කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ලංසුවෙහි නම සඳහන් කොට 2026.09.04 දින 14.00 පැයට (ප.ව.2.00) හෝ ඊට පෙර අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.මුද්‍රා තබන ලද ලංසු "සභාපති,ප්‍රසම්පාදන කමිටුව,ප්‍රාදේශීය සභාව,බඩල්කුඹුර" යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ,කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කල යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. අනුපිටපත,මුල් පිටපතෙහි සියලුම පිටු සහතික කරන ලද ඡායා පිටපතක් විය යුතුය.

10. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම් වෙතින් (දුරකථන/ෆැක්ස් - 0552250175, ඊ මේල්- badalkumburaps1@gmail.com) මඟින් විමසා ලබාගත හැක.

11. 2026.11.20 දින දක්වා ලංසු වලංගු විය යුතුය.

12. 2026.09.04 දින ප.ව.2.00 ට (14.00 පැයට) ලංසු විවෘත කිරීම සිදු කරනු ලබන අතර එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේදී සිදු කෙරේ.

13. 2026 .09.02 දින පෙ.ව.10.30 ට බඩල්කුඹුර ප්රාදේශීය සභාවේ දී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වීමට නියමිත අතර, මේ පිළිබඳ උනන්දුවක් දක්වන අභිලාෂී ලංසුකරුවන් හට ස්වකීය වියදමින් මෙම රැස්වීමට සහභාගී විය හැකිය.

14. ලද ලංසු අතරින් ඕනෑම යෝග්‍ය ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර මේ සම්බන්ධව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,**
**බඩල්කුඹුර.**
**දුරකථන - 055-2250175**
**ඊ මේල්- badalkumburaps1@gmail.com**